# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1760/47 – 2012 ජුනි 01 වැනි සිකුරාදා – 2012.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2011 සැප්තැම්බර් මස 15 වැනි දින අංක 1723/29 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2011 අංක 203 දරන (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් සහ අංක පු/කල්/2011/126 දරන ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අංක 01, 02, 03, 04 යන ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් 04 මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/12/2011/සීරිබී/18.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කල්/3/1/ගවබ/කරඹ/3/31.
2012 මැයි මස 22 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුත්තලම් පත්තුව සහ කඩවත් සුළු කොට්ඨාසයේ කරඹේ, ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පු/කල්/2011/126 සහ 2011.07.28 වැනි දින දරන ප්‍රගමන අනුරේඛනයේ පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින්, ප්‍රමාණයන්ගෙන් සහ මායිම්වලින් යුක්ත ඉඩම් කොටස් හතර (04):

01. **කැබලි අංක 1 – කරඹේ තෝට්ටම් ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.4275ක් පමණ**

උතුරට: මාර්ග (ප්‍රාදේශීය සභා) සහ මාර්ග (මා.සං.අ.); නැගෙනහිරට සහ දකුණට: ඇළ; බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා).

02. **කැබලි අංක 02 – කරඹේ තෝට්ටම් ඉඩම – ප්‍රමාණය: හෙක්. 4.9660ක් පමණ**

උතුරට: මාර්ග (මා.සං.අ.); නැගෙනහිරට: එන්. එම්. රොවෙල් සහ ෆයිරූප් හිමිකම් කියන කරඹේ තෝට්ටම්; දකුණට: ඒ. ජේ. එම්. බණ්ඩාර මැණිකේ, ඒ. එම්. ප්‍රැන්සිස්, ඒ. එම්. පියදාස, කේ. සුජිත් ප්‍රියංකර සහ ඩබ්ලිව්. කේ. සුසන්ත හිමිකම් කියන කරඹ තෝට්ටම් සහ අගල; බටහිරට: කැබලි අංක 03.

03. **කැබලි අංක 03 – කරඹේ තෝට්ටම් ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0571ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: කැබලි අංක 02; දකුණට: අගල සහ කැබලි අංක 04; බටහිරට: කැබලි අංක 04 සහ ඇළ.

04. **කැබලි අංක 04 – කරඹේ තෝට්ටම් ඉඩම – ප්‍රමාණය: හෙක්. 7.3618ක් පමණ**

උතුරට: ඇළ සහ කැබලි අංක 03; නැගෙනහිරට: අගල; දකුණට සහ බටහිරට: ඇළ.

06 - 623